# ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

RDB

## නිපුණතා පූර්ණ තරුණ තරුණියන් සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ රැකියා අවස්ථා

දිවයින පුරා ශාඛා 276 ක් සහ 2500 ට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා සුදුසුකම් සහිත නිපුණතා පූර්ණ සහ කාර්යශූර තරුණ තරුණියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පුහුණු බැංකු සහකාර

**අවශ්‍ය සුදුසුකම්**

මව් භාෂාව (සිංහල / දෙමළ) සහ ගණිතය ඇතුළුව සම්මාන පහක් (05) සහිතව අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයන් හයක් (06) එකවර සමත්ව තිබීම,

සහ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය දැනුම හැර) එක්වර සමත් වී තිබීම.

අ.පො.ස (උසස් පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සහ සාමාන්‍ය දැනුම සමත් වී තිබීම, පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා තම මව් භාෂාවට අමතරව අනෙකුත් භාෂාවකින් කටයුතු කිරීමේ හැකියාව අමතර සුදුසුකම් වේ.

තවද ග්‍රාමීය හා ප්‍රජාමූල කටයුතු වලදී සක්‍රියව දායක වී ඇති තරුණ තරුණියන් කෙරෙහි සම්මුඛ පරීක්ෂණයේදී විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 23 ට නොවැඩි විය යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2021.09.05 දින වේ.

**තෝරාගැනීමේ පටිපාටිය**

ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් තරග විභාගයකින් සහ සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලැබේ. ලිඛිත තරග විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වේ.

| විෂය | කාලය | මාධ්‍යය | ලකුණු |
|---|---|---|---|
| විශ්ලේෂණ දක්ෂතා / බුද්ධි පරීක්ෂණය | පැ 01 | සිංහල / දෙමළ / ඉංග්‍රීසි | 100 |
| සාමාන්‍ය දැනීම | පැ 01 | සිංහල / දෙමළ / ඉංග්‍රීසි | 100 |

ඉහත විභාගයෙන් සමත්වන සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. දිස්ත්‍රික් පදනම මත අපේක්ෂකයින් තෝරාගනු ලබන අතර, 2021/09/05 දිනට ඔවුන් එම දිස්ත්‍රික්කයේ අවම ආසන්න වසර 05 ක කාලයක් ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

**පත්වීම් ලබා දීම හා සේවා කොන්දේසි**

මෙම පත්වීම වසර 02 ක පුහුණු කාලයකට යටත් වේ. වසර 2 ක පුහුණු කාලයෙන් පසුව සුදුසුකම් ලබන්නන් එම තනතුරේ වසර 01 ක පරිවාස කාලයකට යටත් වේ. පුහුණු කාල සීමාව තුළ කාර්යය සාධන ඇගයීමට යටත් වන අතර, තනතුර ස්ථිර කිරීමේදී ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව සමත් වීම හෝ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සලකා බලනු ලැබේ.

**වැටුප් පරිමාණය**

පුහුණු කාලය තුළ පළමු වසරේදී රු. 22,000/- ක මාසික ස්ථාවර දීමනාවක් ගෙවනු ලබන අතර, දෙවන වසරේදී රු. 25000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. සාර්ථක ලෙස වසර දෙකක පුහුණු කාලය නිමකරන්නන් බැංකු සහකාර 5-I ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, ආරම්භක මූලික වැටුප් පරිමාණය (රු. 32,480 - 280 X 20 - 38,080) පරිදි වේ.

**අයදුම්පත් යොමු කිරීම**

ඔබගේ අයදුම්පත මාර්ගගත (On line) ක්‍රමයට ඉදිරිපත් කිරීම සඳහා අපගේ "https://www.rdb.lk/careers" යන වෙබ් පිටුව වෙත පිවිස එහි "Application for the post of Trainee Banking Assistant" තෝරාගන්න.

Careers තිරයේ ඇති "Instructions to Candidates" යටතේ ඇති ගොනුව හොඳින් කියවා ලබා දී ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කරන්න.

තරග විභාගයට ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

ඉහත අයදුම් කිරීමේ පටිපාටියෙන් බැහැර ව වෙනත් කිසිදු ක්‍රමයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් සිදු කෙරෙන ඕනෑම ආකාරයක බලපෑමක් හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමක් මෙම තනතුර සඳහා තෝරා ගැනීමට නුසුදුසුකමක් වේ.

තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

**ප්‍රධාන මානව සම්පත් නිලධාරී,**
**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,**
**අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.**
**දුරකථන අංකය - 011-2035454**